# ශිෂ්‍යත්ව විභාග පෙරහුරු පරීක්ෂණය

## EXAMINATION FOR GRADE FIVE STUDENTS (MODEL PAPER)

## I - පත්‍රය

විභාගඅංකය - ..................................................

**මිනිත්තු 45 යි.**

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :


- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉරි මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊටයටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමුවන පරීක්ෂක<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/I/S |
| දෙවන පරීක්ෂක<br>පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | <br>V/I/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | <br>V/I/S |
| ප්‍රධාන පරීක්ෂක<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණු නිවැරදි ය. | <br>V/I/S |




1) කොටුව තුළ ඇති කාණ්ඩයට ගැළපෙන රූපය තෝරන්න.



1.  2.  3. 

2) මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට ගැළපෙන කොටස තෝරන්න.



1.  2.  3. 

3) අන්තර් සම්බන්ධතාවයක් දක්නට ලැබෙන පිළිතුර තෝරන්න.

1. ලීටර<br>කාලය<br>මිලිමීටර

2. සතුට<br>දුක<br>බිය

3. පැය<br>දිග<br>මිනිත්තු

4) අන්තර් සම්බන්ධතාවයක් දක්නට නොලැබෙන පිළිතුර තෝරන්න.

1. අඩු මිටිය - කියත

2. ගෙදැල්ලකරුව - වාහන්පතුරු

3. අතංගුව - මනිස් ලැල්ල


❖ ප්‍රශ්න අංක **5** සහ **6** ට පිළිතුරු ලිවීමේ දී රටාව අනුව ඊළඟට ගැළපෙන පිළිතුර තෝරන්න.


5) **5034 , 6035 , 7036 , ..............................**

**1. 8037 2. 7037 3. 8038**

විභාගඅංකය -........................................

6)




❖ පහත 07 හා 08 යන ප්‍රශ්නවල පළමු වචන දෙක අතර සම්බන්ධතාවයක් ඇත. එම සම්බන්ධතාවය රැකෙන පරිදි හිස්තැනට ගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

7) වඩුවාට : කියත නම් පෙදරේරුවාට : ........................................................

1. ලඹය 2. අතංගුව 3. යතු කැටය


8) කුල්ල : පෙළීමට නම් පෙනේරය : ........................................................

1. ගැරීම 2. පෙරීම 3. හැලීම

9) ළිඳක් කැපීම සඳහා මිනිසුන් 06 දෙනෙකුට පැය 04ක් ගත විය. එය පැය 03 කින් කපා අවසන් කිරීමට මිනිසුන් කී දෙනෙක් අවශ්‍ය වේ ද?


1. 8 2. 12 3. 24

10) පහත ඝනකවල D අක්ෂරයට විරුද්ධ පැත්තේ ඇති අක්ෂරය සොයා යටින් ඉරක් අඳින්න.





1. A 2. E 3. F

11) පහත රූපයේ ඇති මුළු සමචතුරස්‍ර ගණන වන්නේ



1. 30 2. 25 3. 38


12) පහත රූපයේ ඇති මුළු ත්‍රිකෝණ ගණන සොයන්න.





1. 12     2. 6     3. 9


❖ රූප දෙස A අක්ෂරයේ සිට බැලූ විට පෙනෙන ආකාරය වන්නේ,

13)






1. 


2. 


3. 

14)




1. 

2. 

3. 


15) අත් දෙකක ඇඟිලි 10ක් ඇත. එසේ නම් අත් දහයක ඇති ඇඟිලි ගණන සොයන්න.


1. 20     2. 50     3. 100


16) නිමල් පාසල් යන විට සෑම දිනකම රුපියල් 4ක් බැගින් කැටයකට දමයි. සතිය අවසානයේ නිමල්ට ලැබුණු මුළු මුදල කීයද?


1. 20     2. 28     3. 25

17) වෘත්තයක් හතරට නවා පහත පරිදි කොටසක් කපා ඉවත් කරන ලදි. දිග හැරිය විට දක්නට ලැබෙන රූපය වන්නේ,



1. 

2. 

3. 

18) 2016 වසරේ ජනවාරි 01 වන දින බදාදා දවසක් නම් 2017 වසරේ දෙසැම්බර් 31 වන දවස කවදාද?

1. බදාදා 2. බ්‍රහස්පතින්දා 3. සිකුරාදා

19) සමන්ගේ වයස අවු : 9 මාස 08කි. සරත්ගේ වයස අවු : 12යි මාස 05කි. දෙදෙනාගේ ම වයස් වල එකතුව සොයන්න.

1. අවු : 21 මාස 12 2. අවු : 22 මාස 1 3. අවු : 23 මාස 2

20) රතු , කහ , කොළ , නිල් , ලෙස කොඩි වැලක පිළිවෙළින් කොඩි අමුණා ඇත. එහි 51 වෙනි කොඩියේ පාට කුමක් ද?

1. රතු 2. කොළ 3. නිල්

21) රතු , නිල් , කළු යන පාට වලින් පෑන් 05 බැගින් පෙට්ටියක දමා ඇත. පෙට්ටිය දෙස නොබලා රතු පෑනක් ගැනීමට නම් අවම වශයෙන් ඉවතට ගත යුතු පෑන් ගණන කීයද?

1. 9 2. 10 3. 11

22) මිනිත්තු 20කට වරක් කොළඹ සිට නුවරට ද මිනිත්තු 40කට වරක් කොළඹ සිට මාතරට ද බස් රථ පිටත් වේ. පෙ.ව. 8.20ට බස් රථ දෙක ම එකවර පිටත් වුණේ නම් නැවත බස් රථ දෙක ම එකවර පිටත් වන වේලාව වන්නේ,

1. පෙ.ව. 9.20 2. ප.ව. 9.00 3. පෙ.ව. 9.00

❖ පහත මිල ගණන් ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

| පොත් 02<br>පෑන් 02 | පොත් 1<br>කතුර 1 | පොත් 1<br>පෑන් 2 |
|---|---|---|
| රු. 70 . 00 | රු. 65 . 00 | රු. 45 . 00 |

23) කතුරක මිල කීය ද?

1. රු. 40 . 00 2. රු. 30 . 00 3. රු. 19 . 00

24) පොත් 03ක් හා පෑන් 04ක් මිලදී ගැනීමට වැයවන මුදල සොයන්න.

1. රු. 215 . 00 2. රු. 115 . 00 3. රු. 170 . 00

25) කෙවින් උදෑසන 7.00ට නිවසින් පිටත්ව මිනිත්තු 20කින් පාසලට යයි. කෙවින් පාසලට ගිය වේලාව සම්මත ඔරලෝසු වේලාවෙන් දක්වන්න.

1. 07 : 20 2. පැය 07 : 20 3. 7 : 20

26) කැඩපතිකින් බැලූ විට නොවෙනස් වන රූපය තෝරන්න.

2. US 2. VO 3. OB

27) මාගේ අම්මාගේ නංගී නෑදෑකමින් මට පුංචි අම්මා නම් පුංචි අම්මාගේ තාත්තා නෑදෑකමින් මාගේ නංගීගේ කවු ද?

1. සීයා 2. බාප්පා 3. මාමා


28) පේළියක සිතුම්ට ඉදිරියෙන් ළමුන් 13ක් ද පිටුපසින් ළමුන් 7ක් ද සිටිති. ඒ අනුව පේළියේ සිටින මුළු ළමුන් ගණන සොයන්න.

1. 19 2. 20 3. 21

29) මිතුරන් 6 දෙනෙකු එකිනෙකා අතර සුබ පැතුම්පත් හුවමාරු කර ගන්නා ලදී. ඔවුන් අතර හුවමාරු වූ මුළු සුබ පැතුම්පත් ගණන සොයන්න.

1. 30 2. 36 3. 40

30) වට්ටක්කා , එළවළු , ආහාර , දැක්වීමට නිර්මාණය කරන ලද රූප සටහනක් පහතින් දැක්වේ. ඒ අනුව A B C අක්ෂර පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,




1. වට්ටක්කා , ආහාර , එළවළු
2. ආහාර , එළවළු , වට්ටක්කා
3. වට්ටක්කා , එළවළු , ආහාර

31) ශ්‍රී ලංකාවේ නිදහස ලැබුණු වර්ෂය අයත් සියවස හා දශකය වනුයේ,

1. 20 වන සියවසේ හතරවන දශකය.
2. 20 වන සියවසේ පස්වන දශකය.
3. 19 වන සියවසේ හතරවන දශකය.

32) පහත දැක්වෙන්නේ මිල ගණන් කිහිපයක් රහස් භාෂාවකින් ලියන ලද ආකාරයයි.


රු. : 452 . 50 - R. BTF . TO

රු. : 225 . 75 – R. FFT . ST

මේ අනුව රු : 756 . 25 ලියන ලද්දේ.

1. R. BTO . SF 2. R. STD . FT 3. R. OSF . BT


33)



ඉහත රූපයේ පාට නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස දැක්වෙනුයේ,

1. 0 . 5 2. 0 . 4 3. 0 . 6

34) පහත දැක්වෙන තරාදියේ දෙපස ඇති වස්තු දෙස බලා ■ ■ හි බරට සමාන වන වස්තු සහිත පිළිතුර තෝරන්න.



1. ▲ ●▲ ● 2. ●▲●● 3. ●▲▮▮

35) මම සංඛ්‍යාවක් සිතුවෙමි. එය පහෙන් ගුණකර දෙකක් එකතු කර ලැබෙන පිළිතුරෙන් 2 ක් අඩු කළ විට පිළිතුර 40 වේ. මා සිතූ සංඛ්‍යාව කීය ද?

1. 8 2. 10 3. 12


36) එක් ස්ථානයකින් ගමන් ආරම්භ කළ මිතුරන් දෙදෙනෙකු එකිනෙකාට ප්‍රතිවිරුද්ධ දිශාවට මීටර් 50 ක් ගමන් කොට එක් අයෙක් තම දකුණු අත පැත්තට හැරී මීටර් 75 ක් ද අනෙක් මිතුරා තම වම් අත පැත්තට හැරී මීටර් 75 ක් ද ගමන් කොට නතර විය. දැන් දෙදෙනා සිටින්නේ කොපමණ දුරකින් ද?

1. 50 m 2. 100 m 3. 75 m

37) පසු ගිය කාලයේ කොවිඩ් වසංගතය නිසා පාසල් පළමුව වසා දැමීමට සිදු විය. මෙයට බලපානු ලැබූ ප්‍රධාන ම හේතුවක් විය හැක්කේ,

1. නිරෝධායන කටයුතු සඳහා පාසල් යොදා ගැනීමට අවශ්‍ය නිසා.
2. සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා
3. කොවිඩ් රෝගී තත්ත්වයට ඉක්මනින් ම ගොදුරු වන්නේ ළමුන් නිසා ය.

38) පහත රූපයෙන් දැක්වෙන චක්‍රය වට කිහිපයක් කරකැවී නතර වූ විට අංක 20 ඉදිරියෙන් " ඇ " අක්ෂරය පැමිණ නතර විය. එවිට අංක 30 ඉදිරියෙන් පිහිටිය යුත්තේ කුමන අක්ෂරය ද?




1. උ
2. ඇ
3. ඉ

39) රථ ගාලක නවතා තැබූ ත්‍රීරෝද රථ හා මෝටර් රථ රෝද සංඛ්‍යාව 39කි. එම රථ ගාලේ තිබූ මුළු වාහන ගණන 11කි. ඒ අනුව ත්‍රීරෝද රථ හා මෝටර් රථ ගණන පිළිවෙළින් වනුයේ,

1. 5 , 5     2. 5 , 6     3. 6 , 5

40) හසිතගේ නිවසේ සහෝදරියන් තිදෙනෙකි. මාලිට වඩා රානි අවුරුදු දෙකකින් වැඩිමහල් ය. රාධා මාලීට වඩා අවුරුදු හතක් වැඩිමහල් ය. පවුලේ බාලම සහෝදරිය කවු ද?

1. මාලි     2. රානි     3. රාධා

# ශිෂ්‍යත්ව විභාග පෙරහුරු පරීක්ෂණය

EXAMINATION FOR GRADE FIVE STUDENTS (MODEL PAPER)

**11 -පත්‍රය**

| විභාගඅංකය - ............................................ | පැය 1 මිනිත්තු 15 යි. |
|---|---|

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉරි මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න (සමහර ප්‍රශ්නවල අනු කොටස් ඇත) .
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට තිත් ඉරිමත පිළිතුරු ලියන්න
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල ට නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමුවන පරීක්ෂක<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/I/S |
| දෙවන පරීක්ෂක<br>පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | <br>V/I/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | <br>V/I/S |
| ප්‍රධාන පරීක්ෂක<br>අධීක්ෂණය කළෙමි. | <br>V/I/S |

**01.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට ඡේදය ඇසුරෙන්ම පිළිතුරු සපයන්න

" වැස්ස නැති හැමදාක ම ලොකු අම්මා පොල් ලෙලි තැළීමට ගියා. තළන ලද ලෙලි, කොහු වුණාට පසු ලොකු අම්මා ඒවා ගෙනැවිත් මිදුලේ දමා වේළා ගත්තා. වේළුණු කොහු නෙළීමෙන් ඇ හදා ගත්තේ මිදුල මැද රන්වන් කොහු වලාකුළක්. ඒ වලාකුළේ මා පෙරළි පෙරළි සෙල්ලම් කළේ පූසි පැටවෙකු මෙන් නිදහසේ. වෙලාවකට මට හිතුණා ඒ රන්වන් කොහු, යෝධ සීයා කෙනෙකුගේ රැවුළක් දෝ කියලා".

- **i.** ලොකු අම්මා පොල් ලෙලි තැළීමට ගියේ කවදා ද? ......................................
- **ii.** වේළුණු කොහු නෙළීමෙන් ඇ හදාගත්තේ කුමක් ද? ......................................
- **iii.** මහාප්‍රාණ අක්ෂරක් සහිත වචනය තෝරා ලියන්න. ....................................
- **iv.** දීර්ඝ ඉස්පිල්ලෙන් පටන් ගන්නා වචනයක් ලියන්න. .......................................
- **v.** විශේෂණ පදයක් ලියන්න. ................................................................................
- **vi.** ඡේදයේ සඳහන් පරිදි උපමාවක් ලියන්න.

  .......................................................................................

**02.** විරාම ලකුණු යොදන්න.
- **i.** මගේ පුතාගේ අතේ ඇඟිලි කීයද
- **ii.** හරි අපූරු කතාවක් නේ

**03.** විරුද්ධාර්ථ පද ලියන්න.
- **i.** දිරන - .......................................................
- **ii.** පුහුණු - ...................................................

**04.** ගැළපෙන නිවැරදි අක්ෂරය තෝරා හිස්තැනෙහි ලියන්න.
- **i.** ගවේෂ................. ශීලි ( න , ණ )
- **ii.** සමනො................. ( ල , ළ )

**05.** මධ්‍ය අක්ෂර දෙකක් සහ ආරෝහණ අක්ෂරයක් සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

**i.** මාලය ii . මහතා iii.බටය

**06.** පහත සඳහන් එක් එක් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ✔ ලකුණ ද වැරදි නම් 'X ' ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

- **i.** පවනි සෙල්ලම් පන්තිය ආරම්භ කළා ය. ( )
- **ii.** අපි දත් මැද මුහුණ සේදුවෙමි. ( )
- **iii.** ගස් සුළඟට වැනෙති. ( )
- **iv.** මිනිස්සු පාරේ වැඩ කළෝ ය. ( )

විභාගඅංකය -..............................

07. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

i. පුද්ගලයෙකි / ධනවත් / කාර්යශූර / ගොවියෙකු / වූ / වස්තුහාමි

..............................................................................................................................

..............................................................................................................................

08. පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවල හිස්තැන් පුරවන්න.

i. පරංගියා ..............................................ගියා වගේ.

ii. නරියා .......................................... තිත්තයි කිවුවා වගේ.

09. ගැළපෙන යුගල පද ලියන්න.

i. කෙළි ..............................................

ii. අරුම ..............................................

10. පහත දැක්වෙන ඉඟි වැකියට (රූඪියට) ගැළපෙන අර්ථය තෝරා යටින් ඉරක් අඳින්න.

i. ඉහේ මලක් පිපුණා ....................................................................................

( යම් විපතකින් යාන්තමින් ගැලවීම යි. , දැඩි සතුටකට පත්වීම යි. )

11. 11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය , ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

i.  ------------------------ ii .  ------------------------

12. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න.

ii. Fisherman ------------------------ ii . Sea ------------------------

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍ය ලියන්න.

i. Our / wash / hands / Let's -

..............................................................................................

ii. Small / is / There / a / van -

..............................................................................................

14. " ක්‍රීඩාපිටිය " යන වචනය දෙමළ බසින් පවසන ආකාරය සිංහල අකුරින් ලියන්න.

..............................................................................................


15. .පහත සඳහන් වාක්‍යයේ අර්ථය සිංහලෙන් ලියන්න.

i. උල්ලේ වරලාමා ------------------------------------

16. " තිස් පන් දහස් දහනවය " සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

..............................................

**17.**




**I.** කොටුව තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව ලියන්න. ..................

**II.** එහි සියස්ථානයේ සඳහන් ඉලක්කමේ නිරූපිත අගය ලියන්න. ........................


**18.**



**I.** දී ඇති රූපයේ පාට කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. ........................

**II.** අඳුරු නොකළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න. ...............................

**19.** පහත දැක්වෙන ඇණයේ දිග කොපමණද? ...............................................




**20.** මල්ලක රතු පාට හා කහ පාට බොත්තම් 40ක් ඇත. එයින් $\frac{1}{4}$ක් රතු පාට බොත්තම් නම් කහ පාට බොත්තම් ගණන කීයද? ................................................................

**21.**

**i.** සතියේ පළමු වන දවස කවදා ද? ..................................................

**ii.** පස්වරු 6 . 30 පැය විසි හතරේ ඔරලෝසුවේ දැක්වෙන ආකාරයට ඉලක්කමෙන් ලියන්න.

.........................................................

**22.** ශ්‍රී ලංකාවේ භාවිතවන නිල් පැහැති වර්ණයෙන් යුත් මුදල් නෝට්ටුව කුමක්ද? ........................

**23.** පහත රෝම ඉලක්කම් එකතු කර ලැබෙන පිළිතුර රෝම ඉලක්කමෙන් ම ලියන්න.


**i.** v + iv = ....................................

**24.** එකක මිල රු. 15 . 00 බැගින් වන අඹ ගෙඩි 05ක් මිල දී ගෙන රු. 100 නෝට්ටුවකින් මුදල් ගෙවූ විට ලැබෙන ඉතුරු මුදල කීයද? ...........................................................

**25.** වෙළෙඳසැලක සෙනසුරාදා දින සීනි 5Kg 600g ක් ද ඉරිදා දින සීනි 4Kg 200g ක් ද විකුණන ලදී. දින දෙකේදී ම විකුණූ සීනි ප්‍රමාණ අතර වෙනස කොපමණද? .........................................

**26.** ඉන්ධන පිරවුම් හලකින් පළමු දිනයේ දී රථයකට ඉන්ධන 5 l 250 mlක්ද දෙවන දිනයේ දී 2 l 600 mlක්ද පුරවන ලදී. දින දෙක තුළ දී රථයට පුරවන ලද මුළු ඉන්ධන ප්‍රමාණය කොපමණද? ...........................

**27.** දී ඇති තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. දඹුල්ලේ සිට මාතලේට ඇති දුර කොපමණ ද? ......................................................

ii. අඩුම දුරක් ඇත්තේ කිනම් නගර දෙක අතර ද? ..................................................

**28.** වෙළෙඳ සැලක තබා ඇති මිල දර්ශනයක කොටසක් **A** වගුවේ දැක්වේ. එම මිල දර්ශනයට අනුව මිලදී ගත් ද්‍රව්‍යයන් **B** වගුවේ ඇතුළත්ය. ඒ අනුව බිල්පතෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.


A

| ද්‍රව්‍යය | මිල |
|---|---|
| පරිප්පු 750g | රු. 180 . 00 |
| සීනි 1Kg ක් | රු. 130 . 00 |
| සැමන් ටින් 1 ක් | රු. 230 . 00 |
| කරවල 500g ක් | රු. 440 . 00 |

| ද්‍රව්‍යය | ප්‍රමාණය | මුදල |
|---|---|---|
| සීනි | 2 kg | රු. 260 . 00 |
| කරවල | 1 kg | I.................. |
| සැමන් ටින් | 03 | රු. 690 . 00 |
| පරිප්පු | II. ...... | රු. 240 . 00 |
| එකතුව | | III... ......... |

B

**29.** 5 ශ්‍රේණියේ සිසුන් පිරිසක් තම පාසල් වත්තේ වගා කරන ලද පැළ වර්ග පිළිබඳ තොරතුරු මෙම ප්‍රස්තාරයේ දැක්වේ.




i. වගා කරන ලද කැරට් පැළ සංඛ්‍යාව මෙන් දෙගුණයක් මිරිස් පැළ වගා කර ඇත. එය ඉහත ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

ii. වැඩියෙන් ම හා අඩුවෙන් ම වගා කළ පැළ වර්ග අතර වෙනස කීයද ද?
..........................................

**30.** " මම රටට වැඩදායක කෙනෙක් වෙනවා ම යි " මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ කුමන පියවර ද?

**1.**උදානය **2.** අධිෂ්ඨානය **3.** ප්‍රාර්ථනාව

**31.** පෘෂ්ටයක ඇලී සිටීම සඳහා විශේෂ පාද සහිත සතෙක් වන්නේ,

**1.** හූනා **2.** කටුස්සා **3.** තලගොයා

**32.** උපදේශාත්මක ග්‍රන්ථයක් නොවන්නේ,

**1.** ලෝවැඩ සඟරාව **2.** සැලළිහිණි සංදේශය **3.** සිරිත් මල්දම

**33.** ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් නිරූපණය වන්නේ,

**1.** සිංහල ජාතිය **2.** ජාතික සමඟිය **3.** ජාතික අභිමානය

**34.** ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් අභිෂේක ලැබුවේ,

**1.** ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා.

**2.** මොනරවිල කැප්පෙටිපොළ දිසාව

**3.** අලුදෙණියේ බණ්ඩා සේනාධිපති.

**35.** අපට ආවේණික ගෘහස්ථ ජන ක්‍රීඩාවක් වන්නේ,

**1.** ඔළිඳ කෙළිය **2.** චක්ගුඩු පැනීම **3.** එළුවන් කෑම

**36.** චන්ද්‍රිකා තාක්ෂණය පිළිබඳ ව මුලින් ම ලොවට හඳුන්වා දුන්නේ,

**1** .ආනන්ද කුමාරස්වාමි මැතිතුමා. **2.** ආතර් සී ක්ලාක් මැතිතුමා.

**3.** මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මැතිතුමා.

**37.** මාංශ භක්ෂක ශාකයක් නොවන්නේ,

**1.**නිල් මොනරුස්ස **2.** කඳුලැස්ස **3.** කිරඩාරම්

**38.** **.1948** නිදහස ලබා ගැනීමට උර දුන් ජන නායකයා වන්නේ,

**1.** ඩී.එස්. සේනානායක මහතා.

**2.** එස්.එම්. සෙනෙවිරත්න මහතා.

**3.** අනගාරික ධර්මපාල තුමා

**39.** " ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව ම වැජඹේවා " යන සමස්ත අදහස ඇත්තේ,

**1.**නිල ලාංඡනය **2.** රාජ්‍ය ලාංඡනය **3.** ජාතික කොඩිය

**40.** ලේන්සුවක වාටිය මැසීමට සුදුසු මැහුම් ක්‍රමය වන්නේ,

**1.**බ්ලැන්කට් මැස්ම **2.** නැටි මැස්ම **3.** වාටි මැස්ම

**41.** ශරිර වර්ධනය සඳහා සුදුසු ආහාරයකි.

**1.**දොඩම් **2.** කොස් **3.** මස්

**42.** විටමින් **A** ඌනතාවයෙන් ඇතිවිය හැකි රෝගයකි.

**1** .අස්ථි දුර්වල වීම. **2.** ඇස් පෙනීමේ දුර්වලතා

**3.** සමේ වියලි බව ඇතිවීම.

**43.** වාහන ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා යා යුත්තේ,

**1.**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය **2.** ප්‍රාදේශීය සභාව 3 තැපැල් කාර්යාලය

**44.** විටමින් C බහුලව අඩංගු ආහාරයකි.

1.නිවිති　　2. තක්කාලි　　3. කෙසෙල්

**45.** ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායි සතෙකු නොවන්නේ,

1.යක්කටුස්සා　　2. කළුවඳුරා　　3. හික්මීයා

**46.** නාගරික ප්‍රදේශවල ජලය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍රයකි.

1.ළිඳ　　2. ආඩියා ළිඳ　　3. නළ මාර්ගය

**47.** ආහාර සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1.ඇඹුල් සහිත ආහාර ඇලුමිනියම් භාජනවල පිසීම.

2.ශීතකරණයේ ගබඩා කළ ආහාර නැවත නැවත රත් කර ආහාරයට නොගැනීම.

3.පලා වර්ග කපා සෝදා ගැනීම.

**48.** ලුණු දිය කළ ජලය සහිත බඳුනකට බිත්තරයක් දැමූ විට සිදු වන්නේ,

1.යට ගිලී යාම.　　2. ජලයේ ඉහළ ට පැමිණීම.　　3. බිත්තරය පුපුරා යාම.

**49.** මාලිමාවක ඊ හිස නිතර ම යොමුව තිබෙන දිශාව වන්නේ,

1.දකුණ　　2. නැගෙනහිර　　3. උතුර

**50.** හදිසි ප්‍රතිකාර ඒකකය ( සුව සැරිය ) සඳහා ඇමතිය යුතු අංකය වන්නේ,

1. 119　　2. 1990　　3. 1920

**51.** ළිඳකින් ජලය ඇද ගැනීමේ දී එය පහසුවෙන් කිරීමට උපකාරී කර ගත හැක්කේ,

1. දැති රෝදය　　2. විද්‍යුත් චුම්භක　　3. කප්පිය

**52.** ශ්‍රී ලංකාවේ ස්වාභාවික වරායකි.

1.කොළඹ වරාය　　2.හම්බන්තොට වරාය　　3.ත්‍රිකුණාමල වරාය

**53.** ඖෂධයක් ලබා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,

1. ඖෂධයේ වර්ණය.
2. නියමිත මාත්‍රාව.
3. ඖෂධ ලබාගත යුතු වාර ගණන.

**54.** ශ්‍රී ලංකාවේ බඔබැබ් ශාකය පිහිටා ඇති නගරය වන්නේ,

1.ත්‍රිකුණාමලය　　2. මන්නාරම　　3. මඩකලපුව

**55.** කළුතර හා ගාල්ල යන දිස්ත්‍රික්ක අයත් පළාත් වන්නේ,

1.උතුරු , උතුරු මැද　　2. දකුණ , නැගෙනහිර　　3. බස්නාහිර , දකුණ

**56.** එකම පළාතකින් මුහුදට වැටෙන ගංගා දෙක

1.කළු ගඟ , කැලණි ගඟ

2. මහවැලි ගඟ , කළු ගඟ

3. නිල්වලා ගඟ , කැලණි ගඟ

57. වර්තමානයේ තොරතුරු හුවමාරු කර ගත හැකි ඉතා වේගවත් පණිවිඩ හුවමාරු ක්‍රමය,
1 .විදුලි පණිවිඩය 2. විද්‍යුත් තැපැල 3. ලිපි

58. ඓතිහාසික තොරතුරු ඇතුළත් ශ්‍රී ලංකාවේ පැරණිත ම ග්‍රන්ථය වන්නේ,
1. ත්‍රිපිටකය 2. මහා වංශය 3. දීප වංශය

59. පින්මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු ...........යන කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
1. සිරිත් මල්දම 2. ලෝවැඩ සඟරාව 3. සුභාෂිතය

60. කාලය රන් හා සමාන ය. කාලය අපතේ යැමට නොදී ප්‍රයෝජනවත් වැඩක යෙදීම ඉතා වැදගත් ය. "කාලයේ වටිනාකම" යන මාතෘකාව පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න.

( සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සබන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු යි.)

1. ........................................................................................................

........................................................................................................

2. ........................................................................................................

........................................................................................................

3. ........................................................................................................

........................................................................................................

(අත් අකුරු සහ පිරිසිදු කම සඳහා ලකුණු 02ක් පිරිනමන්න)